# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

பொலிஸ் ஊடகப் பிரிவு

POLICE MEDIA DIVISION

14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.10.27 පැය 0955 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/1951/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


<u>**පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු ජනමාධ්‍ය වෙත යොමු කිරීම.**</u>

**01. මනුෂ්‍ය ඝාතනයක් - ගලෙන්බිඳුණුවැව පොලිස් වසම.**

2025.10.26 වන දින රාත්‍රී කාලයේදී ගලෙන්බිඳුණුවැව පොලිස් වසමේ ඉහලගම ප්‍රදේශයේ වායු තුවක්කුවකින් වෙඩි තැබීමක් හේතුවෙන් පුද්ගලයෙකු තුවාල ලබා ගලෙන්බිඳුණුවැව රෝහලට ඇතුලත් කිරීමෙන් අනතුරුව මියගොස් ඇති බවට ලද පණිවිඩයකට අනුව ගලෙන්බිඳුණුවැව පොලිසිය මගින් විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 57 ක් වූ ඉහලගම, ගලෙන්බිඳුණුවැව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු හා මරණකරුගේ බිරිඳගේ පියා අතර ඇතිව තිබූ ආරවුලක් දුරදිග යාමෙන් බිරිඳගේ පියා විසින් වායු තුවක්කුවකින් මෙම වෙඩි තැබීම සිදු කර ඇති බවට දැනට සිදු කරන ලද විමර්ශනයේදී අනාවරණය වී ඇත.

මෘත ශරීරය ගලෙන්බිඳුණුවැව රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර සැකකරු අත්අඩංගුවට ගැනීම සඳහා ගලෙන්බිඳුණුවැව පොලීසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**02. කේරළ ගංජා සමග සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා විශේෂ මෙහෙයුම් ඒකකය.**

2025.10.26 වන දින උදෑසන කාලයේදී දොම්පේ පොලිස් වසමේ නාගහදෙණිය ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා විශේෂ මෙහෙයුම් ඒකකයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත සැකකටයුතු නිවසක් පරීක්ෂා කර කේරළ ගංජා කිලෝ 196 ග්‍රෑම් 218ක්, ජංගම දුරකතන 02ක් සමග සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන දොම්පේ පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**සැකකරු වයස අවුරුදු 44 ක් වන පාළුගම,දොම්පේ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

දොම්පේ පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**